**ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2021**

------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි 15 වගන්තිය අනුව, අවසන් තොගවල වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම්වලින් වඩා අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් ශුද්ධ උපලබ්ධි අගය සලකා බැලීමකින් තොරව රු.6,744,735 ක් වූ පොත් අගය මත තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිති අංක 09 අනුකූලව තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට 2021 වසරේදී සැලසුම් කර තිබූ නමුත් රටේ පැවති අයහපත් වාතාවරණය හේතු කොට ගෙන එම සැලසුම් කල කාර්යය ඉටු කිරීමට නොහැකි විය. එබැවින් ගිණුම් ප්‍රකාශ වල තොග වටිනාකම ප්‍රමිතියට අනුකූලව පෙන්වීමට 2022 වර්ෂයේ දී කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතයේ පරිදි තොගවල වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම්වලින් අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයට අයත් ඉඩම් හෙක්ටයාර 431.78 ක නාමික වටිනාකම ලෙස රු.4,237,430 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් එම ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉටුකර ගැනීමට නොහැකි වූ බැවින් සුදුසුකම් ලත් තක්සේරුකරුවකු මාර්ගයෙන් තක්සේරු වාර්තා ලබා ගැනීමට දැනට කටයුතු කර ඇත. ඒ අනුව ඉඩම් හෙක්ටයාර 431.78ට අදාළ | ඉඩම්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | තක්සේරු වටිනාකම ද ඇතුළුව මුළු ආයතනික ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන වටිනාකම 2022 වසරේදී මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට පියවර ගනු ලැබේ. | |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොග වටිනාකම තුළ අභාවිත තොගය රු.489,000 ක් සහ සංචලනය නොවන තොගය රු.434,249 ක් ලෙස දක්වා තිබුණද එම තොගවලට අදාළව උපලේඛනවල අගයන් පිළිවෙලින් රු.1,512,680 ක් සහ රු.752,000 ක් වූ බැවින් පිළිවෙලින් රු.1,023,680කින් සහ රු.317,751 කින් තොග වටිනාකම අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම යටතේ නිශ්කාර්ය තොගය වශයෙන් රු.489,000 ක්ද සංචලනය නොවන තොගය වශයෙන් රු.434,249 ක ශේෂයක්ද 2016 ගිණුම් වර්ෂයේ සිට ඉදිරියට පවතී. එසේ වුවත් තොග පාලන ගිණුමේ ශේෂය රු.9,213,691 ක් වන අතර 2021.12.31 දිනට එහි හඳුනාගත් නිශ්කාර්ය තොග වටිනාකම රු.1,512,680 ද, සංචලනය නොවන තොග වටිනාකම රු.752,000 ද වේ. එබැවින් අදාල නිවැරදි කිරීම් 2022 වර්ෂයේදී කරනු ලැබේ. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදි වටිනාකම් ඇතුළත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් රු.5,214,500 ක් 2011 වර්ෂයේ සිට 2021 දක්වා වර්ෂ 11 ක් මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරියට ගෙන එමින් පවතින නමුත් එය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මේ පිළිබඳ විධිමත් තොරතුරු පොත්වල නොමැති බැවින් මෙය ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගෙන ඇති අතර 2012.09.26 දින අමාත්‍යාංශ අනුමැතියට ඉදිරිපත් කර ඇත.එසේ වුවද මේ සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බැවින් මේ පිළිබඳ නැවත අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කටයුතු කරනු ලැබේ. | රජයට අයවිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 4:7 වගන්තිය | අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 04 සිට වර්ෂ 30 දක්වා කාලය තුළ මණ්ඩලයට අයවිය යුතු ශේෂ එකතුව රු.3,509,706 ක් සම්බන්ධයෙන් එම ශිෂ්‍යත්වලාභීන්ගෙන් අයකර ගෙන නොතිබුණු අතර අදාළ ලිපිගොනු අස්ථානගත කර ඉදිරි කටයුතු නවතා තිබුණි. | අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා බැඳුම්කර කොන්දේසි කඩකල නිලධාරීන් 04කට අදාල ලිපිගොනු අස්ථානගත වී නොමැති අතර, නිලධාරීන් තිදෙනෙකුගෙන් ආයතනයට අයවිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.එක් නිලධාරියෙකු සම්පූර්ණ මුදල ගෙවා නිම කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ඇස්තමේන්තු වටිනාකම රු.4,300,000 ක් වූ වාහන 06 ක් භාවිතයෙන් ඉවත් කර වසර 02 ත් 09 ත් අතර කාලයක් ගතවී තිබුණද, එම වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ පැරණි වාහන 6ක් ඉවත් කිරිම සඳහා හඳුනා ගෙන ඇති අතර එම වාහන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2015 අනුව අපහරණය කිරිම සඳහා 2021 වසරේ මුල කටයුතු ආරම්භ කළ නමුත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපහරණ කටයුතු ප්‍රමාද විය. එසේ වුවත් දැනට එම වාහන අපහරණය කිරිම සඳහා මිල ගණන් කැඳවීමට අනුමැතිය අමාත්‍යාංශය මගින් ඉල්ලා ඇත. අදාළ අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව නොපමාව භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 15,873,555 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප/ ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 10,850,732 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,022,823 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන හා වතුවල ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | වෙනස | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| රජයේ ප්‍රදාන | 423,490,000 | 414,000,000 | 9,490,000 | 2 |
| වෙනත් ආදායම් | 10,657,312 | 10,927,301 | (269,989) | (2) |
| විලම්භිත ආදායම් | 139,733,221 | 143,037,426 | (3,304,205) | (2) |
| වතු ආදායම් | 118,624,133 | 94,848,165 | 23,775,968 | 25 |
| වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ | 377,217,587 | 315,631,115 | 61,586,472 | 19 |
| සැපයුම් හා පරිභෝජන වියදම් | 24,033,699 | 8,038,748 | 15,994,951 | 199 |
| නඩත්තු වියදම් | 49,633,350 | 25,507,224 | 24,126,126 | 94 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 111,860,976 | 96,874,142 | 14,986,834 | 15 |
| වෙනත් වියදම් | 113,496,929 | 205,869,599 | 92,372,670 | 45 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 5.3 : 1 ක් හා 4.9 : 1 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගයන් පිළිවෙලින් 3 : 1 ක් හා 2.7 : 1 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවති ණයගැතියන් 466 දෙනෙකුගෙන් අයවිය යුතු රු.14,044,349 ක් වූ ශේෂය අයකර ගැනීමට කටයුතු නොකර මුළු මුදල සඳහාම බොල්ණය ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි. එම ණයගැති ශේෂයන් අයකර ගැනීමට නොහැකි තත්ත්වයක පවතින බැවින් එම ශේෂය ලියාහැරීමට කටයුතු කර නොතිබුණි. | 2021.12.31 දිනට ණයගැති ශේෂය රු.14,407,500න් වසර 10ට වැඩි ශේෂය රු.14,044,349 ක් වේ. එම ණයගැතියන්ගෙන් රු. 2,599,565ක මුදලක් ගැලපුම් කිරීමට කටයුතු යොදා ඇත. ඉතිරි ණයගැතියන් 197 ගේ ණයගැති මුදල් සඳහා අවශ්‍ය ගැළපුම් කිරීමට කටයුතු කරනු ලැබේ. | ණයගැති ශේෂ අයකර ගැනීමට අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගත යුතු අතර ගැළපුම් සඳහා විධිමත් අනුමැතීන් ලබා ගත යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් 2019 සහ 2020 යන වර්ෂවලදී ආරම්භ කර එම වර්ෂ 02 ක තුළදීම අවසන් කිරීමට නියමිතවූ රු.11,188,313 ක මුළු වටිනාකමැති කාර්යාල ගොඩනැගිලි තැනීම, නිල නිවාස සංවර්ධනය වැනි ඉදිකිරීම් 04 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | 2019 සහ 2020 වර්ෂ වලදී ආරම්භ කරන ලද නවීකරණ කටයුතු සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වලින් 4 ක් 2021 වර්ෂය අවසාන වන තෙක් නිම කිරීමට නොහැකි වී තිබුණි. මෙම වැඩ නිම කිරීම ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වූයේ රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වයන් හා පවතින උද්ධමනකාරි වෙළඳපල මත අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමට නොහැකි වීම නිසාය. එබැවින් මෙම කොන්ත්‍රාත් ඉදිරියේදී අවසන් කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිකිරීම් කටයුතු ප්‍රමාදයකින් තොරව නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ සිලිකා පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා නවසීලන්ත විශ්ව විද්‍යාලයක් වෙතින් රු.1,081,074ක් මණ්ඩලයට ලැබී තිබුණු අතර 2022 ජූලි 31 දින දක්වාම එම මුදල් අදාළ ව්‍යාපෘතියට උපයෝජනය කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිලිකා පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා නවසීලන්ත විශ්ව විද්‍යාලයක් වෙතින් මෙම මුදල ලැබී ඇත. මෙම මුදල භාවිතා කොට දැනට රු.466,250ක මුදලක් ගෙවීමට කටයුතු කර ඇති අතර ඉතිරි මුදල් භාවිතා කොට ව්‍යාපෘතියට අදාල වියදම් ගෙවීමට කටයුතු කිරීමෙන් අනතුරුව ඉතිරිය ආදායමට බැර කර 2022 වර්ෂයේ ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් අදාළ ව්‍යාපෘති කාර්යසාධන මට්ටම ඉහළ නංවා ගැනීමට උපයෝජනය කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලය විසින් 2016 පෙබරවාරි මාසයේ වෛද්‍යාධාර අරමුදලක් වශයෙන් රු.5,000,000 ක් ලංකා බැංකුවේ ඉතුරුම් ගිණුමක තැන්පත් කර තිබුණි. මෙම තැන්පතුව පවත්වා ගැනීම සඳහා මහා | ආයතනයේ සේවකයන්ට වෛද්‍යාධාර ප්‍රතිලාභ ලබා දීම සඳහා අරමුදලක් පිහිටුවීමට රබර් පර්යේෂණායතන සංශෝධිත 1961 පනතේ අංක 58 හි ප්‍රතිපාදන අනුව 2016 වර්ෂයේදී | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත අරමුදල ක්‍රියාත්මක මට්ටමේ පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර කිසිදු වෛද්‍යාධාර මුදලක් මෙතෙක් ගෙවීම් සිදු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.6,219,318 ක් වී තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු5,000,000 ක් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර ඇත. ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇතත් අනුමැතිය ලැබී නොමැත. ඉදිරියේදී විගණන හා කළමණාකරන කමිටුවේ නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩල වෙත වාර්තා කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඉ) | 2017 වර්ෂයේ මණ්ඩලයේ පවතින විදුලි රැහැන් පද්ධතිය නවීකරණය කිරීම සඳහා රු.143,934 කට විදුලි කණු 10 ක් සහ 2019 වර්ෂයේදී ගිණුම් අංශයේ ලේඛනාගාරය නවීකරණය සඳහා රු.83,536 කට Dura Panel Board 20ක් මිළදී ගෙන තිබුණද 2022 ජූලි 31 දින දක්වාම එම උපකරණ භාවිතයට ගෙන නොතිබුණි. | ආයතනයේ පවතින විදුලි රැහැන් පද්ධතිය නවීකරණය කිරීම සඳහා මෙම විදුලි කණු මිලදී ගෙන තිබුණද, එම කටයුතු කිරිමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන 2022 වර්ෂයේ නොමැති බැවින් ඉදිරියේදි අදාල නවීකරණ කටයුතු කිරිමට, කටයුතු කරන ලෙස නේවාසික ඉංජිනේරු වෙත උපදෙස් ලබාදි ඇත.<br>ගිණුම් අංශයේ ලේඛණාගාරය සකස් කිරීම සඳහා වැඩ අංශය විසින් නිවැරදි අධ්‍යනයක් නොකර Dura pannal 10 ක් ඇණවුම් කර මිලදී ගැනීමට කටයුතු කර ඇත. එසේ වුවද පසුව එය අදාල කාර්ය සඳහා නොගැළපෙන බව හඳුනාගත් බැවින් එය වෙනත් කාර්යයන් සඳහා භාවිත කිරිමට වැඩ අංශයේ ගබඩා කර ඇත. | පූර්වප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු අතර වත්කම් උපයෝජනය විධිමත් කළ යුතුය. |
| (ඊ) | මණ්ඩලයේ ගබඩාවේ පැවති එකතු වටිනාකම රු. 1,119,838 ක් වූ වර්ෂ 05 ක සිට භාවිතා නොවන භාණ්ඩ අයිතමයන් 228 ක් සමාලෝචිත වර්ෂය දක්වාම අපහරණය කර නොතිබුණි. | 2021.12.31 වන දිනට භාවිතයට ගත නොහැකි ලෙස ගබඩාවේ පවතින විනාශ වූ හා භාවිතා නොවන අයිතම ලැයිස්තුව සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතම යොමු කර ඇති අතර ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව ඉල්ලුම් කරනු ලබන අයිතම වේ නම් ඒවා ඒ ඒ දෙපාර්තමේන්තු වෙත නිකුත් කිරිමට අවශ්‍ය පියවර මේ වන විටත් ගෙන ඇත.<br>එසේ නිකුත් කිරීමෙන් පසු තව දුරටත් ඉතිරි වන අයිතමයන් මිල ගණන් කැඳවා විකිණීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු දැනට ආරම්භ කර ඇත. | මණ්ඩලයේ භාවිතා නොවන අයිතමයන් උපරිම මට්ටමෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු අතර අපහරණ කටයුතු ද කඩිනම් කළ යුතුය. |

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ තනතුර 2017 වර්ෂයේ සිට 2022 ජූලි 31 දින දක්වාම වර්ෂ 05 ක කාලයක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරට නිලධාරියකු පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. එම තනතුර නිත්‍ය තනතුරක් බැවින් කඩිනමින් බඳවා ගැනීම සිදුකළ යුතු වුවද අතිරේක අධ්‍යක්ෂවරයා එම තනතුරෙහි වැඩබැලීම සඳහා පත්කර තිබුණි. | මෙම තනතුර 2018 දෙසැම්බර් මස පුරප්පාඩු විය. ඒ සඳහා 2019 ජනවාරි මස අයදුම්පත් කැඳවා 2019 පෙබරවාරි 28 වැනි දින සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද නමුත් එහි ප්‍රතිඵල අමාත්‍යාංශය විසින් නිකුත් නොකරන ලදී. පසුව 2021 නැවත අයදුම්පත් කැඳවන ලදී. එහෙත් අමාත්‍යාංශ අනුමැතිය නොලැබීම හේතුවෙන් අදාල සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි විය. | මණ්ඩලයේ ප්‍රධාන නිත්‍ය තනතුරේ පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලන තනතුර 2017 වර්ෂයේ සිට පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩුව පිරවීම සඳහා 2021 වර්ෂයේ අයදුම්පත් කැඳවා මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් දෙදෙනෙකු තෝරා ගෙන සම්මුඛ පරීක්ෂණයේ අවසාන නිර්දේශයද ලබාගෙන ඇති නමුත් එම තනතුරට නිලධාරියකු බඳවාගැනීම වර්ෂ 05 ක පමණ කාලයක් ප්‍රමාද කරමින් පැවතිණි. මේ හේතුව නිසා අගලවත්ත ප්‍රධාන කාර්යාලය, රත්මලාන කාර්යාල හා නිවිතිගලකැලේ,කුරුවිට,මොනරාගල සහ පොල්ගහවෙල යන උප මධ්‍යස්ථානයන්වල පරිපාලන කටයුතුද නිසි ආකාරයෙන් සිදුකර ගැනීමට නොහැකිව තිබුණි. | මෙම ආයතනයේ අත්‍යාවශ්‍යයෙන්ම පිරවිය යුතු පුරප්පාඩු හඳුනා ගෙන ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීම සලකා බැලීම සඳහා 2022 අගෝස්තු 23 වැනි දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී සාකච්ඡාවක් පවත් වන ලදී. එහිදී මෙම තනතුර පිරවීමට අදාල සම්මුඛ පරීක්ෂණය නිමකර අදාල නිර්දේශ අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. අදාල ලේඛණ සමඟ නැවත අනුමැතියක් ඉල්ලා සිටින ලෙසට එදින අප වෙත උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව එම ඉල්ලීම අමාත්‍යාංශය වෙත දැනටමත් ඉදිරිපත් කර ඇත. | මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ ප්‍රධාන පර්යේෂණ නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් සහ පර්යේෂණ නිලධාරීන් 59 දෙනෙකු අනුමතවී ඇති අතර පර්යේෂණ අංශය සඳහා ප්‍රධාන පර්යේෂණ නිලධාරීන් 10 ක්ද, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් 13 ක් සහ පර්යේෂණ නිලධාරීන් 14 ක් වශයෙන් පර්යේෂණ නිලධාරීන් 37 | ප්‍රධාන පර්යේෂණ නිලධාරි තනතුර සඳහා අභ්‍යන්තරව අයදුම්පත් කැඳවීමට අනුමැතිය ලබා දෙන ලෙසට අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇත. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි තනතුරු | පුරප්පාඩු පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය නැවත සලකා බලා අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |

දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. ඒ අනුව පර්යේෂණ අංශයේ පමණක් සියයට 62 ක පුරප්පාඩු පවතින අතර එම තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම ඉතාම ප්‍රමාද තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

පුරප්පාඩු පිරවීමටද අයදුම්පත් කැඳවා ඇත. මෙම තනතුරු පුරප්පාඩු පිරවීමේ ඇඩි අවශ්‍යතාවය පැහැදිලි කර එම ඉල්ලීම අමාත්‍යාංශය වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. පර්යේෂණ නිලධාරි තනතුරු පුරප්පාඩු සියල්ල පිරවීමට මේ වන විට අයදුම්පත් කැඳවා ඇත. අවස්ථානුකූලව එම පුරප්පාඩු සංඛ්‍යාවෙන් ද සීමිත පුරප්පාඩු සංඛ්‍යාවක් බඳවා ගැනීමට බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාර අදාළ ලිඛිත පරීක්ෂණ පැවැත්වීමට විශේෂ අවසරයක් ලබා දෙන ලෙස කරුණු පැහැදිලි කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.